පාරිසරික සහ සමාජ ආරක්ෂණ කළමනාකරණ සැලැස්ම (ESMP)

ව්‍යාපෘතිය නිසා ඇතිවිය  හැකි අහිතකර පාරිසරික සහ සමාජීය ගැටළු අවම කිරීම සඳහා කොන්ත්‍රාත්කරුගේ වගකීම

| | පරිසරයට සහ සමාජයට වන බලපෑම සහ අවදානම් මට්ටම | බලපෑම් ඇති කරන ප්‍රධාන ව්‍යාපෘති ක්‍රියාකාරකම් | අහිතකර බලපෑම් අවම කිරීමට කොන්ත්‍රාත්කරු විසින් ගත යුතු ක්‍රියාමාර්ග | බලපෑම් අවම කිරීමට යන පිරිවැය | වගකිවයුතු පාර්ශවය | අධීක්ෂණය |
|---|---|---|---|---|---|---|
| 1 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මහජනයා විසින් පැමිණිලි ඉදිරිපත් කිරීම පැමිණිලි සහ ප්‍රජා සහයෝගය නොමැතිකම | පාර්ශවකරුවන් අතර තොරතුරු හුවමාරුකරගැනීම | 1. ව්‍යාපෘතිය මගින් බලපෑමට ලක් වන පුද්ගලයන්හට ව්‍යාපෘතිය, එහි අරමුණ,සැලසුම් සහ ප්‍රතිඵල පිළිබඳව දැනුවත් කළ යුතුය.<br>2. දුක්ගැනවිලි/පැමිණිලි සහ ඒවා විසඳීමට ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ සටහන් කොන්ත්‍රාත්කරු විසින් පවත්වා ගතයුතුය.<br>කොන්ත්‍රාත්කරුගේ පරිසර සහ සමාජ ආරක්ෂණ නිලධාරියා විසින් වැඩබිමෙහි  ඇතිවිය හැකි අහිතකර තත්ත්ව අධීක්ෂණය කිරීම හා කළමනාකරණය කිරීම කල යුතුවේ. | ඉන්ජිනේරු වියදම් | කොන්ත්‍රාත්කරු | ප්‍රාදේශීය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය / පරිසර ආරක්ෂණ නිලධාරී/ සමාජ ආරක්ෂණ නිලධාරී |
| 2 | සංස්කෘතික වටිනාකම් ඇති භෞතික සම්පත් සොයාගැනීමක් හෝ ඒවාට හානි වීමේ තත්ත්වයන් | වැඩබිම තුල ගතයුතු ක්‍රියාමාර්ග | ව්‍යාපෘති කටයුතු අතර වැඩබිමෙන් පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇති ද්‍රව්‍ය හෝ ඒවැනි ස්ථානයක් මතුවීම හෝ සොයාගැනීමක් සිදු වුවහොත් පහත සඳහන් පරිදි කටයුතු කල යුතුවේ.<br>1. ඉදිකිරීම් කටයුතු වහාම නවත්වා නේවාසික ඉංජිනේරුවරයාගේ අනුමැතිය ඇතිව සොයාගත් අඩවි ප්‍රදේශය තුළ යම් වස්තුවක් තිබේනම් එයට විය හැකි හානියක් හෝ අලාභය වැළැක්වීමට ඒ ස්ථානය බාහිර බලපෑම් විලින් ආරක්ෂිතව තැබිය යුතු අතර නේවාසික ඉංජිනේරුවරයා හරහා වගකිවයුතු බලධාරීන්ට, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට සහ පළාත් පාලන | ඉන්ජිනේරු වියදම් | කොන්ත්‍රාත්කරු | ප්‍රාදේශීය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය / පරිසර ආරක්ෂණ නිලධාරී/ සමාජ ආරක්ෂණ නිලධාරී |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | ආයතනවලට පැය 24ක් ඇතුළත දැනුම් දීම කල යුතුවේ.<br>2. වැඩබිමෙහි කටයුතු නැවත ආරම්භ කළ හැකි වනුයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් අවසරය ලැබුණු පසුවය. | | | |
| 3 | ස්වභාවික සම්පත් අධික ලෙස නිස්සාරණය කිරීම | අමුද්‍රව්‍ය ලබාගැනීම | 1. කොන්ත්‍රාත්කරු විසින් ස්වභාවික සම්පත් ආශ්‍රිත ඉදිකිරීම් ද්‍රව්‍ය එනම් වැලි, ගල්, පස් ආදිය ලබාගැනීමේදී ඒවා ලබාගතයුත්තේ බලපත්‍රලාභී මූලාශ්‍රවලින් හෝ වැවෙන් අමුද්‍රව්‍ය ලබාගැනීමට දී ඇති උපදෙස් මත පමණි.<br>2. රක්ෂිත හෝ ඒලෙස නම් කරන ලද ප්‍රදේශවලින් කිසියම් ද්‍රව්‍යයක් ලබා ගැනීම සපුරා තහනම් වේ.<br>3. කොන්ත්‍රාත්කරු වාණිජමය නොවන පස් /ගල්කොරි ස්ථාන භාවිතා කරන්නේ නම්,ඒවා ලබා ගැනීමෙන් පසු එම ස්ථාන නිසි ලෙස වසාදැමීම කළ යුතුය.<br>4. පස් ලබා ගන්නා ස්ථාන සහ රොන් මඩ ඉවත් කිරීමට අදාලව ඇමුණුම් අංක 01 සහ 02 අනුව කටයුතු කළ යුතුය. | ඉන්ජිනේරු වියදම් | කොන්ත්‍රාත්කරු | ප්‍රාදේශීය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය / පරිසර ආරක්ෂණ නිලධාරී/ සමාජ ආරක්ෂණ නිලධාරී |
| 4 | කන්නයක් මග හැරීම නිසා සිදු සිදුවන පාඩු | ඉදිකිරීම් වියළි කාලයෙන් ඔබ්බට ව්‍යාප්ත වුවහොත් | 1. වියළි සහ යල කන්නයේ දී ඉදිකිරීම් අවසන් කිරීම සඳහා ප්‍රජාව සමඟ සාකච්ඡා කර ඉදිකිරීම් කාලසටහන සැලසුම් කරන්න. අවශ්‍ය නම්, නියමිත කාලයට පෙර ජලය නිකුත් කරන ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටීමෙන් කල්තියා වගා කිරීමට කටයුතු සැලසීම සිදු කල යුතුවේ.<br>2. වියළි කාලයෙන් ඔබ්බට ව්‍යාප්ත වන ඉදිකිරීම් හේතුවෙන් ගොවීන්ට වගා කන්නයක් අත්හැරීමට සිදුවේ නම් වන්දි ලබා දීමට අවශ්‍ය කටයුතු සැලසීම | ඉන්ජිනේරු වියදම් | කොන්ත්‍රාත්කරු | ප්‍රාදේශීය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය / පරිසර ආරක්ෂණ නිලධාරී/ සමාජ ආරක්ෂණ නිලධාරී |
| 5 | ගස් ඇතුලු ස්වභාවික පරිසරයට සිදුවන බලපෑම | ගස් ඉවත් කිරීම , වැව් බැම්ම ප්‍රතිසංස්කරණය / වාහන සහ යන්ත්‍ර සූත්‍ර ගමන්කිරීම | 1. ගස් ඉවත් කිරීමකදී ඒ පිළිබඳ ඉංජිනේරුවරයාට පරිසර නිලධාරියා සහ සමාජ ආරක්ෂණ නිලධාරියා කල්තියා දැනුම් දිය යුතුය. ඉවත් කිරීමට අවශ්‍ය වන ගස් සඳහා ඉවත් කිරීම හැර විකල්පයක් නොමැතිකම යන්න පිළිබඳව තාක්ෂණික සාධාරණීකරණ වාර්ථාවක් ලබාදීම. | ඉන්ජිනේරු වියදම් | කොන්ත්‍රාත්කරු | ප්‍රාදේශීය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය / පරිසර ආරක්ෂණ නිලධාරී/ සමාජ ආරක්ෂණ නිලධාරී |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2. වැව් ප්‍රතිසංස්කරණය කිරීමේදී ගස් ඉවත් කිරීමේ අවශ්‍යතාව හඳුනා ගත් විට පහත පියවර අනුගමනය කළ යුතුවේ.<br>i. ඉවත්කල යුතු ගස් සංඛ්‍යාව හඳුනාගෙන එම ගස් විශේෂය, වටප්‍රමාණය ආදිය සටහන් කර ලේඛනගත කිරීම, අදාළ පළාත් පාලන ආයතනයේ (LA), මධ්‍යම පරිසර අධිකාරිය (CEA) පූර්ව අවසරය ඇතිව ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර ඉදිකිරීම් ස්ථානවලින් ගස් ඉවත් කළ යුතුය.<br>ii. ඉවත් කරන ලද ආර්ථික වටිනාකමක් ඇති ගස් රාජ්‍ය දැව සංස්ථාවට භාර දිය යුතුය.<br>iii. කපා දැමූ ගස් සංඛ්‍යාව මෙන් අවම වශයෙන් දෙගුණයක ගස් ප්‍රමානයක් නැවත වගා කිරීම ව්‍යාපෘති ප්‍රදේශය තුළ සිදු කළ යුතුය. | | | |
| 6 | ආක්‍රමණික ශාක විශේෂ ව්‍යාප්ත වීම | වැඩ බිම තුල අනවශ්‍ය ශාක ඉවත් කිරීම, ද්‍රව්‍ය ප්‍රවාහනය | 1. ඉවත් කරන ලද ශාක වැස්ම හා පස් ආදිය ඉදිකිරීම් භූමියට සහ ඉන් පිටතට ප්‍රවාහනය කිරීමේදී වාහන ආවරණය කළ යුතුය.<br>2. ඉදිකිරීම් ද්‍රව්‍ය ලෙස ස්වභාවික පරිසරයෙන් ගත් ද්‍රව්‍ය සමග වැඩ බිම සහිත පරිසරයට ආක්‍රමණශීලී ශාක විශේෂ කිසිවක් නොයන බවට සහතික වීම සඳහා එම ද්‍රව්‍ය ලබාගන්නා ස්ථාන පරීක්ෂා කළ යුතුය.<br>3. හැකිතාක් දුරට එම ස්ථානයට කිලෝමීටර් 10ක අරයක් ඇතුළතින් ලබාගැනීම් සිදු කල යුතුවේ. | ඉන්ජිනේරු වියදම් | කොන්ත්‍රාත්කරු | ප්‍රාදේශීය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය / පරිසර ආරක්ෂණ නිලධාරී/ සමාජ ආරක්ෂණ නිලධාරී |
| 7 | අවට ඇති වෘක්ෂලතාදියට සහ නිවාස වලට දූවිලි උත්පාදනය ඇතුළු වායු දූෂණය මගින් වන බලපෑම් | සොරොව්ව, වාන් සහ බැම්ම වැඩිදියුණු කිරීම ආදී කටයුතු<br><br>වෘක්ෂලතා ඉවත් කිරීම<br><br>ඉදිකිරීම් ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සහ ගබඩා කිරීම | 1. මෙම දූවිලි විමෝචන ප්‍රභවයන් හැකිතාක් මිනිස් ක්‍රියාකාරකම් වලින් සහ ස්වභාවික ජලාප්‍රවාහන මාර්ග වලින් ඈත් විය යුතුය.<br>2. කාලගුණය තුළ දූවිලි මට්ටම අඩු මට්ටමක තබා ගැනීම සඳහා අඩවිය වම වශයෙන් දිනකට 2/3 වතාවක් තෙත් කළ යුතුය.<br>3. පස්, වැලි සහ අනෙකුත් ඉදිකිරීම් ද්‍රව්‍ය ප්‍රවාහනය කරන වාහන ආවරණය කළ යුතුය. එවැනි වාහනවල වේගය සීමා කිරීම අවශ්‍ය වේ. ජනාකීර්ණ ප්‍රදේශ හරහා ගමනාගමනය වැළැක්විය යුතුය.<br>4. අපද්‍රව්‍ය නිසි ලෙස ඉවත් කරන තුරු, ඒවා ජලාප්‍රවාහන මාර්ගවලට අවම බාධාවක් සහ ගමනාගමනයට බාධා ඇති නොවන ස්ථානයක ගබඩා කර තැබිය යුතුය. | ඉන්ජිනේරු වියදම් | කොන්ත්‍රාත්කරු | ප්‍රාදේශීය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය / පරිසර ආරක්ෂණ නිලධාරී/ සමාජ ආරක්ෂණ නිලධාරී |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | ද්‍රව්‍ය ගබඩා අංගන සැකසීම | | | | |
| 8 | අධික ශබ්දය සහ කම්පන අවට ඇති නිර්මිතයන් හා පවත්නා ඉදිකිරීම් වලට සහ වන ජීවීන්ට බලපෑම් ඇතිකිරීම | උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක කිරීමේදී හා ද්‍රව්‍ය ප්‍රවාහනය හා ගබඩා කිරීමේදී | 1. වැඩ කරන කාල සීමාව තුල ශබ්ද/කම්පන උත්පාදන කටයුතු පෙ.ව 6.00 සිට ප.ව. 6.00 දක්වා පමණක් සිදු කිරීම.<br>2. සියලුම උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර 75 dB නොඉක්මවන ලෙස ක්‍රියා කළ යුතුය. | ඉන්ජිනේරු වියදම් | කොන්ත්‍රාත්කරු | ප්‍රාදේශීය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය / පරිසර ආරක්ෂණ නිලධාරී/ සමාජ ආරක්ෂණ නිලධාරී |
| 9 | ගංවතුර සහ ජල කඩිති ලෙස ජලය එක් රැස් වීමට තුඩු දෙන මතුපිට ජලාප්‍රවාහන මාර්ග අවහිර කිරීම | ප්‍රවේශ මාර්ග සැපයීම ඇතුළුව ස්ථාන සැකසීම, | 1. ජලාප්‍රවාහ වලට බාධාවක් ඇති නොවන ස්ථානයක සුන්බුන් අපද්‍රව්‍ය සහ රොන්මඩ බැහැර කිරීමේ ස්ථාන පවත්වා ගැනීමට කොන්ත්‍රාත්කරු කටයුතු කල යුතුය.<br>2. ඉදිකිරීම් අතරතුර ඇළ දොළ අවහිර වීම වැළැක්වීම හා විකල්ප ජලාපවාහන මාර්ගයක් සැපයීම. | ඉන්ජිනේරු වියදම් | කොන්ත්‍රාත්කරු | ප්‍රාදේශීය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය / පරිසර ආරක්ෂණ නිලධාරී/ සමාජ ආරක්ෂණ නිලධාරී |
| 10 | පාංශු ඛාදනය | ඉදිකිරීම් කටයුතු, රොන්මඩ ඉවත් කිරීම සහ මතුලිට පස ඉවත් කිරීම. | 1. පස් සහ අනෙකුත් ඉදිකිරීම් ද්‍රව්‍ය වැව්, ඇළ දොල ඉවුරු තුළ නොදැමියය යුතුය.<br>2. වැව් සහ ඒ ආසන්න ජල මාර්ගවලට අවසාදිත ජලය ගලා යාම වැළැක්වීම සඳහා පියවර ගත යුතුය. | ඉන්ජිනේරු වියදම් | කොන්ත්‍රාත්කරු | ප්‍රාදේශීය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය / පරිසර ආරක්ෂණ නිලධාරී/ සමාජ ආරක්ෂණ නිලධාරී |
| 11 | වැවෙන් ඉවත්කල රොන්මඩ යෙදීමෙන් මතුපිට පසෙහි ඵලදායිතාව අඩු විය හැකි තත්වය. | ඉවත් කරන ලද රොන්මඩ බැහැර කිරීම | 1. රොන්මඩ බැහැර කිරීමේ සැලැස්ම ඉදිරිපත් කර එමගින් රොන්මඩ බැහැර කරන ස්ථාන පැහැදිලිව සඳහන් කළ යුතුය.<br>2. රොන්මඩ ඉවත් තෝරාගත් ඉඩමට ගම්වාසීන්ගේ සහ අදාළ බලධාරීන්ගේ කැමැත්ත අනිවාර්ය වේ.<br>3. අමුද්‍රව්‍ය ලබාගන්නා වලවල් ව්‍යාපෘතියට ආසන්නයේ ඇති විට එම වළවල් පුනරුත්ථාපනය කිරීමේදී රොන්මඩ ද්‍රව්‍ය බැහැර කිරීමට භාවිතයට ගැනීම සලකා බැලීම. | ඉන්ජිනේරු වියදම් | කොන්ත්‍රාත්කරු | ප්‍රාදේශීය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය / පරිසර ආරක්ෂණ නිලධාරී/ සමාජ ආරක්ෂණ නිලධාරී |
| 12 | සත්ව හා ශාක ප්‍රජාවට හානි සහ වනජීවී ප්‍රදේශ ආශ්‍රිතව සැරිසරන අලි ඇතුන්ට වන බලපෑම | ශාක වැස්ම ඉවත්කිරීමේදී | 1. පරිසර එළිපෙහෙලි කිරීමේදී ප්‍රදේශයෙහි සතුන්ගේ වාසස්ථාන විනාශ වීම හෝ වෘක්ෂලතාදිය විනාශ වීම වළක්වා ගැනීමට නිසි සැලකිල්ලක් දැක්විය යුතුය. | ඉන්ජිනේරු වියදම් | කොන්ත්‍රාත්කරු | ප්‍රාදේශීය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය / පරිසර ආරක්ෂණ නිලධාරී/ සමාජ ආරක්ෂණ නිලධාරී |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2. ඉවත් කරන ලද ශාක වෙනත් පරිසර පද්ධති වලට හානි නොවන ලෙසින් වහාම කලින් තීරණය කළ ස්ථානවලට බැහැර කළ යුතුය.<br><br>3. ඉදිකිරීම් අතරතුර අලි ඇතුන්ට ජලය සඳහා ප්‍රවේශය අවහිර නොවන බව කොන්ත්‍රාත්කරු සහතික කළ යුතුය.<br><br>4. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ව්‍යාපෘති භූමියේ හෝ ඒ අවට ප්‍රදේශවලින් කිසිඳු ස්වභාවික ශාක ද්‍රව්‍යක් හෝ සතුන් ඉවත් නොකළ යුතුය. | | | |
| 13 | ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම | ව්‍යාපෘති භූමිය පිරිසිදු කිරීම හා කම්කරු කඳවුරුවලින් අපද්‍රව්‍ය ඉවත් කිරීම | 1. කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස ඇතිවන අපද්‍රව්‍ය පලමුව වර්ගීකරණයකට ලක්කර එක් එක් අපද්‍රව්‍ය වර්ගය සඳහා බැහැර කළ හැකි ස්ථාන පිළිබඳව පලාත්පාලන ආයතනයෙහි උපදෙස් ලබා ගත යුතුය.<br>2. ඕනෑම අන්තරායකර ආකාරයේ අපද්‍රව්‍යක් බැහැරකිරීමේදී විශේෂ සැලකිල්ලක් දැක්වීමත්, පලාත්පාලන ආයතනයෙහි උපදෙස් ලබා ගැනීමත් සිදු කල යුතුවේ. | ඉන්ජිනේරු වියදම් | කොන්ත්‍රාත්කරු | ප්‍රාදේශීය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය / පරිසර ආරක්ෂණ නිලධාරී/ සමාජ ආරක්ෂණ නිලධාරී |
| 14 | පොදු/වෘත්තීය ආරක්ෂණ ප්‍රවාහය සම්බන්ධ ගැටළු (උදා. ස්ත්‍රී පුරුෂ සමාජ භාවය අනුව ඇතිවන ගැටුම් / කාන්තා හිංසනයන් GBV) | ආරක්ෂණ ක්‍රියාමාර්ග ගැනීම | පුහුණුව<br>1. කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර, සියලුම දෙනා සඳහා සෞඛ්‍ය සහ මහජන ආරක්ෂණ අවදානම් පිළිබඳව දැනුවත් කිරීමග<br>2. පුද්ගලික ආරක්ෂක උපකරණ (PPE) සියලුම සේවකයන්ට ලබාදීම<br>3. විය හැකි අනතුරු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමට සහ එවැනි උවදුරුවලින් මහජනතාව ආරක්ෂා කිරීමට අනතුරු ඇඟවීමේ සංඥා භාවිතය.<br>4.<br>හදිසි ක්‍රියා පටිපාටිය<br><br>1. හදිසි ආධාර සේවාවක් සේවා ස්ථානයේ තිබිය යුතුය. | ඉන්ජිනේරු වියදම් | කොන්ත්‍රාත්කරු | ප්‍රාදේශීය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය / පරිසර ආරක්ෂණ නිලධාරී/ සමාජ ආරක්ෂණ නිලධාරී |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2. කොන්ත්‍රාත්කරු සැම විටම වැඩබිමෙහි ප්‍රථමාධාර කට්ටලයක් තබා ගත යුතුය.<br><br>ස්ත්‍රී පුරුෂ සමාජ භාවය අනුව ඇතිවන ගැටුම්<br><br>1. බාහිර ශ්‍රමිකයින් පැමිණීම අවම කිරීම සඳහා හැකිතාක් දේශීය ශ්‍රමිකයන් බඳවා ගැනීම - බඳවාගැනීමේ දී කාන්තාවන්ට යම් ප්‍රමුඛත්වයක් **<u>ලබා</u>** දීමට කටයුතු කිරීම.<br><br>2. රැකියා කොන්ත්රාත්තුවේ කොටසක් ලෙස සේවක චර්යාධර්ම සංග්‍රහය ඇතුළත් කරන්න - මෙහිදී සේවකයින්ගේ හැසිරීම් හා ආකල්ප, කාන්තා හිංසනයන් වැළැක්වීම සඳහා යොමුවන ලෙස සැකසීම.<br><br>3. කොන්ත්‍රාත්කරුවන් ශ්‍රම බලකාය පුහුණු කිරීමේදී පරිසර සමාජ ආරක්ෂණ ක්‍රම මගහැරීම අවමවන ලෙසත් ලිංගික හිරිහැර/GBV වැළැක්වීම සඳහා ශක්තිමත් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමටත් වග බලා ගත යුතුවේ. | | | |
| 15 | සේවක නවාතැන්, කඳවුරු වල සෞඛ්‍යාරක්ෂිතභාවය කළමණාකරණය | රෝග සම්ප්‍රේෂණය වීම වලක්වාගැනීම | සේවක නවාතැන් කඳවුරු පවත්වා ගැනීම<br><br>1. කම්කරුවන්ට ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් කඳවුරු තුළ තිබිය යුතුය.<br>2. ප්‍රදේශයේ පුහුණු ශ්‍රමිකයින් නොමැති තත්වයකදී හැර බාහිරින් කම්කරුවන් සේවයේ යොදා නොගැනීම හා හැකි පමණ නවාතැන් කඳවුරුවල කම්කරුවන් නවාතැන් ගැන්වීම.<br><br>3. එච්.අයි.වී/ඒඩ්ස් පිළිබඳවත් කම්කරුවන් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම.<br><br>4. වසංගත හා බෝවන රෝග වැළැක්වීම සඳහා සෞඛ්‍යාරක්ෂිත මාර්ගෝපදේශ අනුගමනය කිරීම. (COVID මාර්ගෝපදේශ) | ඉන්ජිනේරු වියදම් | කොන්ත්‍රාත්කරු | ප්‍රාදේශීය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය / පරිසර ආරක්ෂණ නිලධාරී/ සමාජ ආරක්ෂණ නිලධාරී |

| | | | | | | |
|---|---|---|---|---|---|---|